<u>අභ්‍යාසය</u>

තොරතුරු පත්‍රිකාව ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. නාට්‍ය පෙළක් යනු කුමක්දැයි හඳුන්වන්න.
2. නාට්‍ය පෙළක ඇතුළත් විය යුතු අංග ලියා දක්වන්න
3. ඔබ නැරඹූ නාට්‍යක් ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.
4. ඔබ කැමති කතාවක් පාදක කරගනිමින් කෙටි නාට්‍ය පිටපතක් නිර්මාණය කරන්න.

| | |
|---|---|
| නාට්‍ය පෙළෙහි නම | |
| චරිත | |
| ස්ථානය | උදා :- වළහා ගේ නිවස |
| කතා සාරාංශය | |
| මූල බීජය | උදා :- මාෂා කැලයේ අතරමං වීම. |
| තේ මාව | |
| දිගු නාට්‍යයක් ද?<br>කෙටි නාට්‍යයක් ද? | |

# <u>තොරතුරු පත්‍රිකාව</u>

- නාට්‍ය කතා වස්තුව ප්‍රෙක්ෂකයන් වෙත ගෙන යාමේදී සංවාද සහ ප්‍රේක්ෂාව ගොඩ නැඟීමට අවශ්‍ය තොරතුරු ඇතුළත් සාහිත්‍යමය ලේඛනය නාට්‍ය පෙළ ලෙස හැඳින්වේ.
- රචකයා මුලින්ම නාට්‍යයේ තේමාව හා ශෛලිය තීරණය කළ යුතු ය.
- නාට්‍ය පෙළ මඟින් රචකයාගේ ජීවන දෘෂ්ටිය හෙළිවේ.
- පෙළක චරිත, සිදුවීම්, අවස්ථා ගොඩනඟා ඇති ආකාරය අනුව රචකයාගේ නිර්මාණශීලීත්වය හා පරිකල්පන හැකියාව තේරුම් ගත හැකිය.
- නාට්‍ය පෙළක සංවාදවලට අමතරව රංග විධාන, ආනුශංගික අංග සහ චරිත පිළිබඳ විස්තර දක්නට ලැබේ.
- නාට්‍ය පෙළ මඟින් කියැවෙන කිසියම් හෝ දෙයක් ඉන් ඉවත් කළහොත් එහි සමස්ත අදහසට කිසිදු බාධාවක් නොවේ නම් එම කොටස් පෙළට අනවශ්‍ය දෙයක් ලෙස සැලකේ.
- ව්‍යාපාරික , සමාජයීය, අධ්‍යාපනික හෝ ඓතිහාසික තොරතුරු සන්නිවේදනය කිරීම නාට්‍ය පෙළකින් කළ හැකි බැවින් එම නාට්‍ය පෙළ යම් කාලයක අනුමාන තොරතුරු මූලාශ්‍රයක් ලෙස ද වැදගත් වේ. එහෙත් තොරතුරු සන්නිවේදනය නාට්‍යයට අත්‍යාවශ්‍ය අංගයක් ලෙස නො සැලකිය යුතු ය.
- ළමා නාට්‍ය පෙළක මුල, මැද, අග වශයෙන් කතාව සරලව හඳුනාගත හැකි අතර වෙනත් නාට්‍යයන්හි සෑම විටම එසේ නොවේ.
- නාට්‍ය පෙළෙහි අනිවාර්යෙන්ම අන්තර්ගත විය යුතු දෙයක් ලෙස ඝට්ටනය හෙවත් ගැටීම හඳුනාගත හැකිය.නාට්‍යයක ගැටුම් ප්‍රභේද කිහිපයක් ම දක්නට ලැබේ.
- රචකයාගේ අවශ්‍යතාවය සහ කතාවේ ස්වභාවය අනුව නාට්‍ය පෙළ දිගු හෝ කෙටි නාට්‍ය පෙළක් ලෙස රචනා කළ හැකිය.
- ඒ අනුව නාට්‍ය පෙළක දක්නට ලැබෙන සුවිශේෂී අංග කිහිපයක් ලෙස,

  - සංවාද
  - චාරිත
  - රංග විධාන
  - නාට්‍යෝචිත අවස්ථා
  - ගැටුම් අවස්ථා
  - ආනුශාංගික අංග

පෙන්වා දිය හැකිය.

සැකසුම -	කේ.එම්.චතුරිකා ප්‍රියදර්ශනී.

ර/නිවි/කහවත්ත මධ්‍ය මහා විද්‍යාලය.

නිවිතිගල කලාප අධ්‍යාපන කාර්යාලය.